# ආරක්ෂක අමාත්‍යාංශය

# ලංසු කැඳවීම

## රාජ්‍ය බුද්ධි සේවාව වෙත පෙරසවි ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ZN AL සැන්ඩ්විච් පැනල් සහ ZN AL EXTRUSIONS සැපයීම

## කොන්ත්‍රාත් අංකය : MOD/ FD/PB/16/II-II/2021

1. ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් පහත විස්තර කර ඇති පරිදි **රු. මි. 60 ක** පිරිවැයකට ඇස්තමේන්තු කර ඇති (වැට් හැර) රාජ්‍ය බුද්ධි සේවාව වෙත පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ZN AL සැන්ඩ්විච් පැනල් සහ ZN AL EXTRUSIONS සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද අයදුම්පත් කැඳවා සිටී.

2. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

3. කොන්ත්‍රාත්තු ප්‍රදානය සඳහා යෝග්‍ය වීමට සාර්ථක ලංසුකරුවන් අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර සැන්ඩ්විච් පැනල් සැපයීම සඳහා අවම වශයෙන් ශ්‍රී ලංකාව තුළ වසර පහකවත් වලංගු ව්‍යාපාර ලියාපදිංචියක් තිබිය යුතු ය. ලංසුකරුවා, පිරිනමන සැන්ඩ්විච් පැනල් නිෂ්පාදකයා විය යුතු ය නැතහොත් එම සැන්ඩ්විච් පැනල් සැපයීම සඳහා බලයලත් දේශීය නියෝජිතයා විය යුතු ය.

4. කොන්ත්‍රාත්තු පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන සුදුසුකම්:

    a. පසුගිය වසර පහ තුළ සිදු කළ සැන්ඩ්විච් පැනල් සැපයීමේ සාමාන්‍ය වාර්ෂික අගය ශ්‍රී.ලං.රු. **මිලියන 200ක්වත්** විය යුතු ය

    b. මෙම ව්‍යාපෘතියේ හෝ වටිනාකම **රුපියල් මිලියන 50 කට නොඅඩු** වෙනත් සමාන ස්වාභාවයේ ව්‍යාපෘතියක වර්ග මීටර් 5,000 ට නොඅඩු වැඩ නිම කළ සැන්ඩ්විච් පැනල් සැපයීමේ ව්‍යාපෘතියක පළපුරුද්ද. මෙම ව්‍යාපෘතිය පසුගිය වසර පහ තුළ සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **රාජ්‍ය බුද්ධි සේවාව (SIS), තැ.පෙ. 582, කොළඹ (දුරඃ 011 2 690 150)** වෙතින් වැඩි දුර විස්තර ලබාගත හැකි අතර **2021 ඔක්තෝබර් 18** සිට **2021 නොවැම්බර් 08** දක්වා **පැය 0900** සිට **පැය 1500** අතර කාලයේදී **සභාපති, අමාත්‍යාංශයීය ප්‍රසම්පාදන කමිටුව, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ** වෙතින් ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය.

6. **2021 ඔක්තෝබර්** 18 සිට **2021 නොවැම්බර් 08** දක්වා **පැය 0900** සිට **පැය 1500** අතර කාලයේදී **රු. විසි දහසක (රු.20,000)** නැවත ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවා **ප්‍රධාන මූල්‍ය නිලධාරී I, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ** වෙත ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකි ය. ගෙවීමේ ක්‍රමය වන්නේ මුදල් මගින් ගෙවීමයි.

7. ලංසු පිටපත් දෙකකින් යුක්තව **2021 නොවැම්බර් 08 දින පැය 1500ට** හෝ ඊට පෙර පහත ලිපිනයට එවිය යුතු ය. එසේ නැතහොත් පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුකරුවන්/ නියෝජිතයින් ඉදිරියේ **2021 නොවැම්බර් 09 වන දින පැය 1100 ට** ලංසු විවෘත කෙරෙනු ඇත.

8. ලංසු, ලංසු කැඳවීමේ අවසන් දිනයේ සිට **දින 91 දක්වා** වලංගු විය යුතු ය.

9. සෑම ලංසුවක්ම **රු.900,000.00 ක** ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතු අතර එය;

    i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ වාණිජ බැංකුවකින් නිකුත් කර තිබිය යුතු ය.

    ii. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් නිකුත් කර තිබිය යුතු ය.

    iii. ඉහත සඳහන් මුදල සඳහා විය යුතු ය.

    iv. ලංසු සුරක්ෂණය කොන්දේසි විරහිත, **2021 නොවැම්බර් 09** සිට **2022 මාර්තු 07** දක්වා වන ඉල්ලුම මත වන ඇපකරයක් විය යුතු ය. (ලංසු විවෘත කරන දින සිට **දින 120** දක්වා)

10. ලංසුව විවෘත කිරීමට අවම වශයෙන් **දින තුනකට (03) පෙර** ලංසු විවෘත කිරීමට සහභාගි වන පුද්ගලයාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය/ගමන් බලපත්‍ර අංකය ලංසුකරුවන් විසින් ප්‍රධාන මූල්‍ය නිලධාරී I, අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත ලිඛිතව දැන්විය යුතුය.

ඉහත සඳහන් කළ ලිපිනය වන්නේ


**පදවි නාමය : සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව**

**ලිපිනය : ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

**දුරකථන අංක :** 011 2 390 719

**ෆැක්ස් අංකය :** 011 2 390 720

**ඊමේල් ලිපිනය :** **procurement@defence.lk**